පත්තිරුව



# 2023
# කාර්ය සාධන වාර්තාව

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

දකුණු පළාත

## පළාත් ඉඩම් කොමසාරිස් තුමාගේ පණිවුඩය



දශක ගණනාවක් පුරා සිදුවන ව්‍යවස්ථාපිත රාජකාරියක් වන රජයේ ඉඩම් රාජකාරී සම්බන්ධ නිසි තොරතුරු නොමැති වීම අප දෙපාර්තමේන්තුවේ පැවැති බලවත් ගැටලුවක් විය. වසර 45 කට අධික කාලයක් තිස්සේ ලබා දී ඇති දීමනාපත්‍ර, බලපත්‍ර, වාර්ෂික බලපත්‍ර හා දීර්ඝ කාලීන බදුකර ආදී ලේඛන පිළිබඳ අප සතුව පැවති තොරතුරු නිවැරදි නොවේ. ඒ අනුව එම තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිවැරදි කිරීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට එතෙක් පැවති ඓතිහාසික තොරතුර සැලකිය යුතු මට්ටමකින් නිවැරදි කිරීමට අපට හැකි විය.

වාර්ෂිකව එම තොරතුරු යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යෑම අප දෙපාර්තමේන්තුවේ මූලික වගකීමකි. එම වගකීම ඉටු කිරීමටත් ගත වූ 2023 වර්ෂය තුළ අප දෙපාර්තමේන්තුව ඉටු කළ රාජකාරි වල සංශිප්තයක් පෙර වර්ෂ සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමටත් මෙම කුඩා ග්‍රන්ථය “පත්ඉරුව” නමින් සම්පාදිතයි.

විවිධ ව්‍යවස්ථාපිත ලේඛන මගින් ජනතාව වෙත බැහැර කර ඇති රජයේ ඉඩම් කැබලි සංඛ්‍යාව යම් තාක් දුරකට හෝ නිවැරදිව හඳුනා ගැනීමට අප සමත් වුව ද, එසේ බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර හෝ අක්කර ප්‍රමාණය නිවැරදිව හඳුනා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තකි. සියලු රජයේ ඉඩම් මැන අවසන් කර නොමැති වීමත්, මැනුම් නොකළ ඉඩම් දීමනා පත්‍ර, බලපත්‍ර හා වෙනත් ලේඛන මඟින් බැහැර කිරීමත්, හේතුවෙන් බැහැර කරන ලද මුලු ඉඩම් ප්‍රමාණාය හඳුනා ගැනීම තවදුරටත් සංකීර්ණ වී ඇත.

කෙසේ වෙතත් 2023 දෙසැම්බර් 31 වන දිනට ඉඩම් නියාදනයට අදාළ අප සතු තොරතුරු නිරීක්ෂණය කිරීමේ දී දකුණු පළාත පුරා විවිධ ලේඛන මගින් ඉඩම් කැබලි 298,609 ක් ජනතාව වෙත බැහැර කර ඇති බව පැහැදිලි වේ. මෙසේ බැහැර කරන ලද ඉඩම්, රටේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියට දායක වී ඇති තරමට අපගේ රාජකාරියේ ඵලදායි බව තීරණය වන බව අපගේ විශ්වාසයයි. එහෙත් ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයන් සිදු නො වන බවද අප දනි.

භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය යන ප්‍රධාන නිෂ්පාදක සාධක අතරින් භූමිය හා ශ්‍රමය යන සාධක මෙරට තුළ සාපේක්ෂව සුලභව ව්‍යාප්තව ඇති අතර ප්‍රාග්ධනය හා ව්‍යවසාය යන සාධක අප රටෙහි දුලබය. අප රාජකාරි දෙස ආර්ථික විද්‍යාත්මකව බැලූ විට පෙනී යන කරුණක් නම්, ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් උත්සහ කර ඇත්තේ භූමිය හා ශ්‍රමය යන මෙ රටේ සුලභ නිෂ්පාදන සාධක දෙක සම්මිශ්‍රණය කොට කෘෂිකාර්මික අංශය දියුණු කිරීම තුළින් ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම බව පැහැදිලිය. 2023 දෙසැම්බර් 31 දින වන විට දකුණු පළාත තුළ අප බෙදා හැර ඇති මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව වන 298,609 ක ප්‍රමාණයෙන් ඉඩම් කැබලි 277,788 ක්ම දීමනාපත්‍ර හා බලපත්‍ර මත බෙදා දී ඇති ඉඩම් වන අතර එය සම්පූර්ණ ඉඩම් කැබලි සංඛ්‍යාවවෙහි ප්‍රතිශතයක් ලෙස 93% කි. ඉන් අති බහුතරයක් යැපුම් මට්ටමේ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් බෙදා දී ඇති ඉඩම් ය.

ප්‍රාග්ධනය යහමින් ඇති ව්‍යවසායකයින් වෙත රජයේ ඉඩම් වෙන් කර දීමේ බලය රජයේ ඉඩම් ආඥා පනත මගින් අප වෙත හිමිව තිබේ. එහෙත් ගත වූ වසර 45කට අධික කාලය තුළ එසේ වෙන් කරන ලද ඉඩම් ප්‍රමාණය නොගිණිය හැකි තරම් අතිශය කුඩාය. එනම් දකුණු පළාතේ ව්‍යාපාර හා වාණිජ කටයුතු වෙනුවෙන් රජයේ ඉඩම් ආඥා පනත අනුව වෙන් කරනු ලැබ ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 239 කි. එය සමස්ත ඉඩම් කැබලි සංඛ්‍යාවට ප්‍රතිශතයක් ලෙස ගත්විට 0.08% කි. එනම් රජයේ ඉඩම් 0.01% අඩු අතිශය ස්වල්ප ප්‍රමාණයක් ව්‍යාපාර හා වාණිජ කටයුතු සඳහා වෙන් කරද්දී ඉතිරි 99.9% කට අධික ඉඩම් කැබලි ප්‍රමාණයක් වෙන් කර ඇත්තේ යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය හා නේවාසික කටයුතු වෙනුවෙනි.

ශ්‍රම සූක්ෂම ආර්ථික ක්‍රියාවලියෙන් ඉවත්ව ප්‍රාග්ධන සූක්‍ෂම සුහුරු ආර්ථිකයක් දෙසට ගමන් කරමින් සිටින නූතනය තුළ, දැනට රජය සතුව ඉතිරිව ඇති සීමිත ඉඩම් ප්‍රමාණය ශ්‍රම සාධකය සමඟ මුසු කොට යැපුම් ආර්ථිකය තුළ ඌණ උපයෝජිත නිෂ්පාදන සාධකයක් බවට පත් වීමට ඉඩ නොදිය යුතු බව අපගේ විශ්වාසයයි. ඒ වෙනුවට ඉහළ ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගැනීමේ අරමුණින්, රජයේ සීමිත ඉඩම් සම්පත ප්‍රාග්ධන සූක්ෂ්ම කර්මාන්ත බිහි කළ හැකි ව්‍යවසායකයින් වෙත දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දීම කාලීන අවශ්‍යතාවයකි.

මන්ද රාජ්‍ය භාණ්ඩාගාරය බරපතළ මූල්‍ය අර්බුදයකට මේ වන විට මුහුණ දී සිටින අතර එය වඩාත් සරලව පැහැදිලි කරන්නේ නම්, රජයේ දේශීය වියදම් පියවා ගැනීමට අවශ්‍ය රුපියල් ද විදේශයන් ගෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය

ඩොලර් ද ප්‍රමාණවත් තරමට රාජ්‍ය භාණ්ඩාගාරය සතුව නොමැත. රජය සතු භාවිතයට නොගත් ඉඩම් නිසි පරිදි රජයේ ඉඩම් ආඥා පනත අනුව දීර්ඝ කාලීන බදු පදනමින් කෘෂිකාර්මික හෝ වාණිජ ආදී නිෂ්පාදන  අවශ්‍යතාවයන් වෙත සුදුසු ව්‍යවසායකයින්ට කඩිනමින් ලබා දීම යනු රජයට අවශ්‍ය රුපියල් මෙන්ම ඩොලර් ආදායම ද උපයා ගැනීමට හැකි වත්මන් ආර්ථික අර්බුදයට පේන මානයේ ඇති විසඳුමකි.

එනම් රජයේ ඉඩම් වල වාර්ෂික බදු මුදල් ලෙස රුපියල් ආදායම් ද, එම ඉඩම් වල ආරම්භ කරන වාණිජ හෝ කෘෂිකාර්මික නිෂ්පාදන ව්‍යාපෘති තුලින් නිපදවන භාණ්ඩ රට තුළට ආනයනය කිරීම අඩු වීමත්, ඇතැම් නිෂ්පාදන විදේශයන් වෙත අලෙවි කිරීමත් යන දෙයාකාරයෙන්ම රාජ්‍ය භාණ්ඩාගාරය සතු ඩොලර් ආදායම් ද, ඉහළ යෑම අනිවාර්ය ප්‍රතිඵල වේ.

මෙසේ පවතින ආර්ථික අර්බුදයට විසඳුමක් ලබා දෙමින්, රජයට අවශ්‍ය රුපියල් හා ඩොලර් ආදායම් ඉහළ දමා ගත හැකි පැහැදිලි ආදායම් ප්‍රභවයක් වන, මේ වන විටත් පළාත් සභාවේ තුන් වන විශාලතම ආදායම් ප්‍රභවය ද වන, රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනමෙන් ලබාදීමේ ක්‍රියාවලිය, ආදායම් අභිමුඛ ඉඩම් නියාදන ක්‍රියාවලියක් ලෙස ඉටු කිරීමට අප දෙපාර්තමේන්තුව අපේක්ෂා කළ ද ඒ සඳහා ඇති ගැටලු රැසකි.

එම ගැටළු විසඳා නොගන්නා තාක් රුපියල් මිලියන 200 ක පමණ වන වත්මන් වාර්ෂික ඉඩම් ආදායම තව දීර්ඝ කාලයක් එම මට්ටමේම පවතිනු ඇති අතර කඩිනමින් එම ගැටළු විසඳා ගන්නේ නම් පළාත් සභාවේ වාර්ෂික ඉඩම් ආදායම් ඉතා කෙටි කලකින් 200% කින් වුව වර්ධනය කර ගැනීම එතරම් අපහසු නැත.

එනම් දීර්ඝ කාලීන බද්දක් සඳහා අනුමැතිය ලබා ගැනීමට සකස් කරනු ලබන ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලැබීමට විශාල කාලයක් ගත වේ. මේ වන විට එසේ සකස් කරන ලද දීර්ඝ කාලීන බදු නිර්දේශ 700 කට අධික ප්‍රමාණයක් කොළඹ කාර්යාල වල සිරවී තිබේ. මේ හේතුවෙන් අදාළ ඉඩම් අපේක්ෂිත ආයෝජකයින් අධෛර්යයට පත් වේ. රජයට ආදායම් අහිමි වේ. නිෂ්පාදන ක්‍රියාවලිය ඇන හිට ආර්ථික වර්ධනය සීමා වේ. රැකී රක්ෂා බිහි වීම ප්‍රමාද වේ.

මේ සා අනිටු ආර්ථික ප්‍රතිවිපාක ජනනය කරන ඉඩම් නියාදන ක්‍රමයක් තවදුරටත් පවත්වා ගෙන යාම, වර්තමානයේ බලවත් ආර්ථික අර්බුදයකින් මිදීමට උත්සාහ කරන අප වැනි රටකට කෙතරම් ගැලපෙන්නේ ද යන්න තදින් සිතා බැලිය යුතු කරුණකි. මෙම අනිටු ආර්ථික ඵල නතර කිරීමට නම් දීර්ඝ කාලීන බදු නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය පළාත් මට්ටමට විමධ්‍යගත කිරීම හෝ ඒ සඳහා අනුමැතිය ලබා දීමේ දී කොළඹ කාර්යාල වල ඇති වන ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා පිළියම් යෙදීම අත්‍යවශ්‍ය කාරණයකි.


එසේම දීර්ඝ කාලීන බදු නිර්දේශ සකස් කිරීමේ දී අප අද අනුගමනය කරන සංකීර්ණ ක්‍රියාවලිය තවදුරටත් සරල කළ යුතු ය. පවතින නීති රීති සංශෝධනය කිරීම මගින් හෝ එම ක්‍රියාවලි සරල කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මන්ද දකුණු පළාත තුළ රජයේ ඉඩම් වල ඉදි කර, දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා කරන විදුලි සංදේශ කුළුණු 107 ක් වැනි ප්‍රමාණයකට බදු අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලේඛන සකස් කිරීමට නොහැකිව තිබෙන්නේ පවතින සංකීර්ණ නීතිමය ක්‍රියාවලිය හේතුවෙනි.

එසේම දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දෙන ඉඩම් මැනුම් කර මානක සැලසුම් සකස් කිරීමේ දී හා තක්සේරු කිරීමේ දී ඇති වන ප්‍රමාදයන් අවම කිරීමට පිළියම් යෙදිය යුතු අතර ඒවා රජයේ ආර්ථික ප්‍රමුඛතා ලෙස සලකා ක්‍රියා කිරීමට ද පෙළඹවීමක් අවශ්‍යය.

එමෙන්ම දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දෙන රජයේ ඉඩම් සඳහා රජයේ තක්සේරු වටිනාකම් මත තීරණය කරන වාර්ෂික බදු ප්‍රතිශත හා මුදල් ද වඩාත් සාධාරණ හා ආයෝජන හිතකාමී ලෙස වෙනස් විය යුතුය. රජයේ ඉඩම් ලබාගෙන ව්‍යාපාර කටයුතු ආරම්භ කරන තෙක් එම කාලයට බදු සහන ලබා දීම, ව්‍යාපාරවල ස්වභාවය, පිරිවැටුම හෝ එ තුළින් බිහි කරනු ලබන රැකියා අවස්ථා ප්‍රමාණය ආදී කරුණු මත, අය කරන බදු ප්‍රතිශත වෙනස් වීම වැනි වඩාත් සාධාරණ ආර්ථික නිර්ණායක මත පදනම් වූ නව බදු ව්‍යුහයක් සකස් කිරීම ද තවදුරටත් ප්‍රමාද නොකළ යුතු වැදගත් අවශ්‍යතාවයකි.

මෙලෙස රජයේ ඉඩම් නියාදනයට අදාළ නීතිරීති යාවත්කාලීන කර, බදු නිර්දේශ සකස් කිරීමට අදාළ ක්‍රියාවලිය සරල හා සාධාරණ එකක් බවට පත් කිරීම සිදු කර, එය පරිගණක පද්ධතියකට ඇතුළත් කර ස්වයංක්‍රීයකරණය කරන්නේ නම් රජයේ ඉඩම් නියාදනය මෙරට ආර්ථික වර්ධන ක්‍රියාවලියේ ප්‍රබල ස්ථානයක් හිමි කර ගනු ඇත. එසේ මෙරට ආර්ථික වර්ධන ක්‍රියාවලියේ තීරණාත්මක සාධකයක් බවට රජයේ ඉඩම් නියාදන ක්‍රියාවලිය පත් වන දිනක පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අප වචනයේ සැබෑ අරුතින්ම අභිමානවත් රාජ්‍ය සේවකයින් බවට පත් වනු ඇත.

සේනක පල්ලියගුරුගේ
පළාත් ඉඩම් කොමසාරිස් - දකුණු පළාත


ඉඩම් කොමසාරිස්
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් ගාල්ල අංශය හා බිදු අංශය
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් මාතර අංශය
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් පාලන හා හම්බන්තොට අංශය
ගණකාධිකාරී
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් ගාල්ල,මාතර හා හම්බන්තොට සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල
රජයේ මිනින්දෝරු
මූලස්ථාන ඉඩම් නිලධාරී
පරිපාලන නිලධාරී
මූලස්ථාන ඉඩම් නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
බිදු/ සැලසුම් අංශය
ගාල්ල අංශය
මාතර අංශය
හම්බන්තොට අංශය
පාලන අංශය
ගිණුම් අංශය
අංශ ප්‍රධානී
මුදල් සහකාර
සංවර්ධන නිලධාරී/ඉඩම් නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී/කළ.සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී/කළ.සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී/කළ.සේවා නිලධාරී
ප්‍රා.ලේ කාර්යාල වල ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී/ සංවර්ධන නිලධාරී
කා.කා.ස.
කා.කා.ස.
කා.කා.ස.
කා.කා.ස.
රියදුරු/කා.කා.ස.
කා.කා.ස.
රියදුරු/කා.කා.ස.
මැනුම් සහයක



# දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.

රජයේ ඉඩම් පරිපාලනය හා කළමණාකරණය සිදු කරනු ලබන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රධාන පනත් පහක් සම්බන්ධයෙන් රාජකාරි ඉටු කරනු ලබයි.

01. 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත
02. 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත
03. 1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත
04. 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත
05. 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

මෙම පනත් උපයෝගී කර ගනිමින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් පහත ප්‍රධාන සංරචකයන් ඔස්සේ සිදු කරනු ලබයි.

01. රජයේ ඉඩම් අයිතිය බැහැර කිරීම.
02. ඉඩම් ආදායම් එකතු කිරීම හා ප්‍රවර්ධනය.
03. ඉඩම් මැන සැලසුම් කිරීම.
04. රජයේ ඉඩම් සංවර්ධනය හා ආරක්ෂා කිරීම.
05. රජයේ ඉඩම් නිරවුල් කිරීම.

උක්ත ප්‍රධාන සංරචක ඔස්සේ වාර්ෂික ඉලක්ක පිහිටුවමින් අප විසින් ඉටු කරනු ලබන ප්‍රධාන රාජකාරි පහත පරිදි වේ.

## 01. <u>රජයේ ඉඩම් අයිතිය බැහැර කිරීම සඳහා අප ඉටු කරනු ලබන රාජකාරි:-</u>

I. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම.
II. බලපත්‍ර ඉඩම් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර හෝ උරුමය වැඩසටහන යටතේ නිදහස් දීමනාපත්‍ර සැකසීම සඳහා නිර්දේශ ලබා දීම.
III. රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික පදනමින් ලබා දී ඇති දීර්ඝකාලීන බදු ඉඩම් සඳහා නිදහස් දීමනාපත්‍ර සැකසීමට නිර්දේශ ලබා දීම.
IV. රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික කටයුතු හා වාණිජ කටයුතු පදනමින් ලබා දී ඇති දීර්ඝ කාලීන බදු ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
V. ආපදාවන්ට ලක් වූ ජනතාව සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දිමනාපත්‍ර ලබා දීමට නිර්දේශ ලබා දීම.
VI. රජයේ දෙපාර්තමේන්තු භුක්ති විඳින ඉඩම් පවරා දීමට නිර්දේශ ලබා දීම.
VII. පළාත් පාලන ආයතන භුක්ති විඳින ඉඩම් පවරා දීමට නිර්දේශ ලබා දීම.
VIII. බෞද්ධ විහාරස්ථාන වෙත පූජාභූමි ඔප්පු හා නිදහස් දීමනාපත්‍ර සැකසීමට නිර්දේශ ලබා දීම.
IX. රජයේ ඉඩම් ආඥා පනත යටතේ සමිති කටයුතු පදනමින් ලබා දී ඇති ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුකර සැකසීමට නිර්දේශ ලබා දීම.
X. ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බෙදා දී ඇති ඉඩම් සඳහා නියාදන සාධන පත්‍ර සැකසීමට නිර්දේශ ලබා දීම.

## 02. <u>ඉඩම් ආදායම් එකතු කිරීම සහ ප්‍රවර්ධනය වෙනුවෙන් අප ඉටු කරන ප්‍රධාන රාජකාරි</u>

I. පහත සඳහන් වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිරීම හා බදු මුදල් එකතු කිරීම.

- **අ.** පදිංචිය සඳහා LC- 75 වාර්ෂික බලපත්‍ර
- **ආ.** එළදාව භුක්ති විඳීම සඳහා LC- 78 වාර්ෂික බලපත්‍ර
- **ඇ.** ජලය හරවා ගැනීම සඳහා LC- 71 වාර්ෂික බලපත්‍ර
- **ඈ.** රජයේ ගොඩනැගිලි බදු දීම සඳහා LC- 77 වාර්ෂික බලපත්‍ර

II. පහත සඳහන් කටයුතු යටතේ ලබා දී ඇති දීර්ඝකාලීන බදු ඉඩම්වලට අදාළ බදු මුදල් එකතු කිරීම හා නව දීර්ඝකාලීන බදු අනුමැතීන් ලබා ගැනීමට නිර්දේශ ලබා දීම.

- **අ.** නේවාසික කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු
- **ආ.** කෘෂිකාර්මික කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු
- **ඇ.** වාණිජ කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු

III. ගැණුම් මිල අයකර ලබාදෙන බලපත්‍ර මගින් අය කළ යුතු තක්සේරු මුදල් අය කිරීම.

IV. මධ්‍යම පාන්තික ඉඩම් සඳහා දීමනාපත්‍ර සැකසීමේ දී, පැවරීමේ දී හා මධ්‍යම පාන්තික ක්‍රමයෙන් බැහැර කිරීමේ දී තක්සේරු වටිනාකම අය කිරීම.

V. රාජ්‍ය ආයතන භුක්ති විඳින ඉඩම්වල එළදාව භුක්ති විඳීම වෙනුවෙන් එළදා බදු එකතු කිරීම.

VI. රජයේ ඉඩම්වල එළදාව වෙන්දේසි කර ආදායම් එකතු කිරීම.

VII. රජයේ ඉඩම්වලින් එකතු කළ යුතු වෙනත් රාජ්‍ය භාගය ආදායම් එකතු කිරීම.

මෙම ආදායම් පළාත් සභාවේ පහත ආදායම් ශීර්ෂ වෙත බැර කරනු ලබයි.


**අ.** රජයේ ඉඩම් ආඥා පනත යටතේ අය කරනු ලබන වාර්ෂික බදු මුදල්, දීර්ඝ කාලීන බදු මුදල් , එළදා බදු මුදල්, වෙන්දේසි බදු හා වෙනත් ආදායම් 2002-01-03 ආදායම් ශීර්ෂයට බැර කරනු ලබයි.


**ආ.** ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අය කරනු ලබන ගැණුම් මිල හා මධ්‍යම පාන්තික ඉඩම්වලට අදාළව අය කරනු ලබන තක්සේරු මුදල් 2002-01-05 ආදායම් ශීර්ෂයට බැර කරනු ලබයි.


## 2020-2023 – ප්‍රගතිය


### බලපත්‍ර සකස් කිරීම - දකුණු පළාත

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 3249 | 1703 | 52% | 6409 | 2766 | 43% | 3317 | 3267 | 98% | 2914 | 3466 | 119% |
| මාතර | 2492 | 572 | 23% | 2881 | 1543 | 54% | 1744 | 1046 | 60% | 1321 | 1497 | 113% |
| හම්බන්තොට | 2240 | 1446 | 65% | 4779 | 748 | 16% | 2648 | 1084 | 41% | 1625 | 1413 | 87% |
| **දකුණු පළාත** | **7981** | **3721** | **47%** | **14069** | **5057** | **36%** | **7709** | **5397** | **70%** | **5860** | **6376** | **109%** |













ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නොමිලේ සහ ගැණුම් මිල කාණ්ඩ දෙක යටතේ පසුගිය වසර හතරක කාලය තුළ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් කච්චේරි අවසන් අනුමැතිය ලබාදුන් ස්ථිර බලපත්‍ර සංඛ්‍යාව මින් නිරූපිතයි.


## දීමනාපත්‍ර සකස් කිරීම - දකුණු පළාත

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 1325 | 1091 | 82% | 1252 | 552 | 44% | 1645 | 746 | 45% | 946 | 803 | 85% |
| මාතර | 991 | 325 | 33% | 668 | 295 | 44% | 939 | 284 | 30% | 457 | 457 | 100% |
| හම්බන්තොට | 1051 | 1136 | 108% | 1011 | 829 | 82% | 1259 | 523 | 42% | 1107 | 1080 | 98% |
| **දකුණු පළාත** | **3367** | **2552** | 76% | **2931** | **1676** | **57%** | **3843** | **1553** | 40% | **2510** | **2340** | 93% |













ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ පසුගිය වසර හතරක කාලය තුළ දීමනාපත්‍ර සකස් කිරීමට අදාළ ව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද නිර්දේශ සංඛ්‍යාව මින් නිරූපිතයි.


# <u>දීර්ඝකාලීන බදු නිර්දේශ ඉදිරිපත් කිරීම - දකුණු පළාත</u>

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 121 | 65 | 54% | 94 | 125 | 133% | 119 | 61 | 51% | 273 | 168 | 62% |
| මාතර | 130 | 22 | 17% | 114 | 31 | 27% | 114 | 42 | 37% | 117 | 90 | 77% |
| හම්බන්තොට | 125 | 84 | 67% | 222 | 141 | 64% | 165 | 25 | 15% | 127 | 123 | 97% |
| **දකුණු පළාත** | **376** | **171** | **45%** | **430** | **297** | **69%** | **398** | **128** | **32%** | **517** | **381** | **74%** |













රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ/ සමිති කටයුතු පදනමින් දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම සඳහා අනුමැතිය පිණිස පසුගිය වසර හතරක කාලය තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද නිර්දේශ වාර්තා සංඛ්‍යාව මින් නිරූපිතයි.


# වාර්ෂික බදුකර සකස් කිරීම LC 75 සහ LC 78 - දකුණු පළාත

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 204 | 131 | 64% | 176 | 212 | 120% | 264 | 133 | 50% | 248 | 601 | 242% |
| මාතර | 524 | 241 | 46% | 336 | 316 | 94% | 340 | 300 | 88% | 418 | 428 | 102% |
| හම්බන්තොට | 139 | 10 | 7% | 50 | 17 | 34% | 150 | 12 | 8% | 98 | 106 | 108% |
| **දකුණු පළාත** | **867** | **382** | **44%** | **562** | **545** | **97%** | **754** | **445** | **59%** | **764** | **1135** | **149%** |





රජයේ ඉඩම් ආඥා පනත යටතේ රජයේ රක්ෂිත ඉඩම් කොටස් පරිහරණය කරන අනවසර පුද්ගලයන් වෙනුවෙන් පසුගිය වසර හතරක කාලය තුළ පදිංචිය/ව්‍යාපාර සඳහා සහ වගා කර එළදාව ලබාගැනීම සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමට ලබා දුන් අනුමැතීන් සංඛ්‍යාව මින් නිරූපිතයි.

## LC 75 - දකුණු පළාත


| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 91 | 42 | 46% | 66 | 88 | 133% | 85 | 31 | 36% | 81 | 208 | 257% |
| මාතර | 234 | 123 | 53% | 116 | 132 | 114% | 131 | 101 | 77% | 137 | 163 | 119% |
| හම්බන්තොට | 115 | 1 | 1% | 30 | 3 | 10% | 50 | 0 | 0% | 31 | 63 | 203% |
| **දකුණු පළාත** | **440** | **166** | **38%** | **212** | **223** | **105%** | **266** | **132** | **50%** | **249** | **434** | **174%** |

## LC 78 - දකුණු පළාත

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 113 | 89 | 79% | 110 | 124 | 113% | 179 | 102 | 57% | 167 | 393 | 235% |
| මාතර | 290 | 118 | 41% | 220 | 184 | 84% | 209 | 199 | 95% | 281 | 265 | 94% |
| හම්බන්තොට | 24 | 9 | 38% | 20 | 14 | 70% | 100 | 12 | 12% | 67 | 43 | 64% |
| **දකුණු පළාත** | **427** | **216** | **51%** | **350** | **322** | **92%** | **488** | **313** | **64%** | **515** | **701** | **136%** |





පසුගිය වසර හතරක කාලය තුළ රජයේ රක්ෂිත ඉඩම්වල එළදාව ලබා ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික බලපත්‍ර






පසුගිය වසර හතරක කාලය තුළ රජයේ රක්ෂිත ඉඩම් වල ගොඩනැගිලි ඉදිකර (නේවාසික හා ව්‍යාපාර සඳහා) භුක්ති විඳීම සඳහා ලබා දෙන ලද වාර්ෂික බලපත්‍ර


# රජයේ බදු ආදායම (රු.) - දකුණු පළාත

| දිස්ත්‍රික්කය | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| ගාල්ල | 29,638,686.62 | 59,029,268.48 | 199% | 33,894,372.41 | 65,502,195.66 | 193% | 103,722,380.39 | 114,501,894.22 | 110% | 75,144,217.94 | 94,422,889.51 | 126% |
| මාතර | 20,184,237.47 | 21,679,523.02 | 107% | 22,841,547.29 | 27,716,372.46 | 121% | 29,886,603.04 | 35,763,412.68 | 120% | 34,543,602.87 | 41,758,431.40 | 121% |
| හම්බන්තොට | 48,664,667.50 | 29,522,648.50 | 61% | 95,690,353.00 | 48,243,767.88 | 50% | 61,972,881.80 | 52,761,650.15 | 85% | 77,375,155.00 | 59,544,117.89 | 77% |
| **දකුණු පළාත** | **98,487,591.59** | **110,231,440.00** | **112%** | **152,426,272.70** | **141,462,336.00** | **93%** | **195,581,865.23** | **203,026,957.05** | **104%** | **187,062,975.81** | **195,725,438.80** | **105%** |













පසුගිය වසර හතරක කාලය තුළ රජයේ ඉඩම්වලින් එකතු කරන ලද සමස්ථ බදු ආදායම ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක වශයෙන් සංසන්දනාත්මකව ඉහත ප්‍රස්ථාරවල නිරූපනය කර ඇත.


| බදු වර්ගය | 2020 | | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| වාර්ෂික බදු ආදායම | 12,826,068.87 | 21,426,383.49 | 18,300,804.04 | 33,187,533.28 | 25,323,044.94 | 17,823,604.43 | 20,794,431.50 | 21,159,073.77 |
| එලදා බදු ආදායම | 1,182,895.70 | 1,425,491.64 | 1,173,463.70 | 1,490,117.00 | 1,826,432.40 | 1,652,826.75 | 2,133,696.00 | 2,299,936.55 |
| දීර්ඝකාලීන බදු ආදායම | 41,072,881.98 | 38,045,233.32 | 48,055,085.28 | 41,478,730.70 | 74,311,683.19 | 84,758,481.03 | 68,970,985.15 | 57,175,137.03 |
| ගැණුම් මිල ආදායම | 15,141,305.50 | 27,898,925.24 | 15,232,954.50 | 37,124,275.92 | 24,071,367.86 | 45,043,991.92 | 29,248,000.39 | 39,058,172.43 |
| හිඟ බදු ආදායම | 26,848,089.54 | 17,331,696.04 | 67,665,641.18 | 20,312,873.00 | 66,332,165.84 | 37,262,486.57 | 54,336,178.77 | 29,808,067.62 |
| වෙන්දේසි බදු හා වෙනත් ආදායම | 1,416,350.00 | 4,103,710.27 | 1,998,324.00 | 7,868,806.10 | 3,717,171.00 | 16,485,566.35 | 11,579,684.00 | 46,225,051.40 |


පසුගිය වසර 4ක කාලය තුළ සමස්ථ දකුණු පළාතේ ඉඩම් වලින් එකතු කරන ලද ආදායම වාර්ෂික බදු, එලදා බදු, ගැණුම් මිල, දීර්ඝකාලීන බදු, එකතු කරන ලද හිඟ බදු ආදායම් හා වෙනත් ආදායම් වශයෙන් වෙන් වෙන්ව පහත ප්‍රස්ථාර වල නිරූපිතයි.

















# හිඟ බදු 2023

| | විස්තරය | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| i | හිඟ දීර්ඝකාලීන බදු මුදල් | 11,878,274.85 | 4,306,680.60 | 33% | 2,843,426.56 | 2,813,579.10 | 101% | 19,351,583.00 | 10,652,648.00 | 53% | 34,073,284.41 | 17,772,907.70 | 50% |
| ii | හිඟ වාර්ෂික හා එළදා බදු මුදල් | 3,578,768.54 | 2,820,819.45 | 61% | 1,120,272.51 | 1,060,367.45 | 70% | 1,539,609.00 | 686,894.12 | 40% | 6,238,650.05 | 4,568,081.02 | 57% |
| iv | හිඟ ගැණුම් මිල | 6,616,364.00 | 3,811,126.60 | 50% | 4,394,965.31 | 1,872,657.30 | 37% | 3,012,915.00 | 1,793,222.00 | 49% | 14,024,244.31 | 7,477,005.90 | 46% |
| **පෙර වර්ෂවලට අදාල ව අය කළ මුළු හිඟ බදු** | | **22,073,407.39** | **10,938,626.65** | **50%** | **8,358,664.38** | **5,746,603.85** | **69%** | **23,904,107.00** | **13,122,837.12** | **55%** | **54,336,178.77** | **29,808,067.62** | **55%** |












2023 වර්ෂයේ දී එක් එක් බදු වර්ෂයට අදාළ ව වාර්තා වූ හිඟ බදු ඉහත ප්‍රසථාරවලින් නිරූපිතයි.

## 2024 වර්ෂය වන විට වාර්තා වී ඇති හිඟ බදු

| හිඟ බදු 2024 | ගාල්ල | මාතර | හම්බන්තොට | දකුණු පළාත |
|---|---|---|---|---|
| දීර්ඝකාලීන බදු මුදල් | 24,741,235.00 | 4,728,775.95 | 38,689,522.00 | 68,159,532.95 |
| වාර්ෂික හා එළදා බදු | 6,271,643.08 | 926,160.07 | 1,302,916.00 | 8,500,719.15 |
| ගැණුම් මිල | 37,592,651.00 | 8,766,014.58 | 1,608,725.80 | 47,967,391.38 |
| **එකතුව** | **68,605,529.08** | **14,420,950.60** | **41,601,163.80** | **124,627,643.48** |







රජයේ ඉඩම් වලට අදාල බදු හිඟය සකස් වී ඇත්තේ වාර්ෂික බදු දීර්ඝකාලීන බදු හා හිඟ ගැනුම් මිල වාරික එකතු වීමෙනි.

පසුගිය වර්ෂ කිහිපයක තොරතුරු පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ  මෙම ඉඩම් බදු හිඟය පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිවැරදි නොවන බවයි. එය නිවැරදිව ගණනය කිරීම අප හමුවේ ඇති අභියෝගයකි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඉඩම් පිළිබඳ (විශේෂයෙන්ම වාර්ෂික බලපත්‍ර ඉඩම් පිළිබඳ) නිවැරදි තොරතුරු නොමැතිවීම, ඉඩම් ආදායම් රැස්කිරීමට අදාළ බදු ලේඛන නිවැරදිව යාවත්කාලීන නොකිරීම, බදුකරුවන් දැනුවත් නොකිරීම, බදු එකතු කිරීමේ අකාර්යක්ෂමතා, වැනි විවිධ කරුණු හේතුවෙන් හිඟ බදු ප්‍රමාණය වාර්ෂිකව වැඩිවී ඇති අතර හිඟය පිළිබඳව නිවැරදිම තොරතුරු ද කාර්යාල වල නොමැත.

නිලධාරීන් දැනුවත් කිරීම, බදු ලේඛන සම්පූර්ණ කිරීමට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම, බදු ඒකක පරීක්ෂාව, වැනි විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සම්පූර්ණ බදු හිඟය හඳුනා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින අතර මේ වන විට හෙළි වී ඇති තොරතුරු අනුව එම හිඟය රුපියල් මිලියන 124 ඉක්මවයි.




වාර්තා ගතවී ඇති සමස්ථ හිඟ බදු ප්‍රමාණය දිස්ත්‍රික්ක වශයෙන්

ඉතා කුඩා බදු මුදලක් බැගින් ඉඩම් කැබලි විශාල ප්‍රමාණයකින් එක් රැස් කිරීම සිදු කළ යුතු බැවින් වාර්ෂික බදු එකතු කිරීම විශේෂයෙන් සංකීර්ණ වී ඇත. මේ තත්ත්වය ජය ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන්ගේ දායකත්වය ඉතා වැදගත් වුවද මේ වනවිට එම ග්‍රාම නිලධාරී වසම් වල වාර්ෂික බදු එකතු කිරීමේ කටයුත්ත ඇතැම් ග්‍රාම නිලධාරීන් විසින්  මුළුමනින්ම අතහැර දමා ඇති බව නිරීක්ෂණය වේ.

ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිබ්බොටුවාව ග්‍රාම නිලධාරී වසමේ වාර්ෂික බදු මුදල් එකතු කිරීමේ ක්ෂේත්‍ර වැඩසටහනේ දී දෙපාර්තමේන්තු සහකාර ඉඩම් කොමසාරිස් විසින් එක් දිනකදී රු. 124, 909.00 ක මුදලක් එකතු කරන ලදී. 2023 වර්ෂයේ මුල් මාස පහ තුළ අදාල ග්‍රාම නිලධාරී විසින් කිසිඳු බදු මුදලක් එකතු කර නොතිබුණි. මෙම නිශ්චිත තොරතුර අපට බදු එකතු කිරීමේ ග්‍රාම නිලධාරී භූමිකාව පිළිබඳ නැවත වරක් සිතා බැලීමට පොළඹවයි.

එබැවින් බදු හිගය එකතු කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා වසමේ ග්‍රාමලධාරීගේ සිට අදාල සියලු නිලධාරීන්ගේ දායකත්වයත්, නිවැරැදි තොරතුරු පද්ධතියක අවශ්‍යතාවයත් පවතින බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# දකුණු පළාතේ ඉඩම් බැහැර කිරීම.

දකුණු පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ සිදු කරන ලද ඉඩම් රාජකාරිවලට අදාළ තොරතුරු පිළිබඳ ගැටලුවක් පැවති අතර ඒ අනුව 2022 වර්ෂය වන විට ඉඩම් බැහැර කිරීමේ ලේඛනවලට අදාළව අප සතුව තිබූ සංඛ්‍යාත්මක දත්ත (Historic Information) අසත්‍ය බව නිරීක්ෂණය විය. නිවැරදි තොරතුරු ලබා ගැනීම සඳහා තොරතුරු සම්මතකරණ වැඩමුළු 03 ක් (validation workshops) 2022 වර්ෂය අවසානයේ දී පවත් වන ලදී.

එහි දී සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ඒ වන විට පැවති ඉඩම් සම්බන්ධ ලේඛන (දීමනාපත්‍ර, බලපත්‍ර/ ලෙජර, දීර්ඝ කාලීන බදුකර සහ වාර්ෂික බදු බලපත්‍ර සංඛ්‍යාව ) ගණනය කරන ලද අතර සෑම වර්ෂයක දී ම අලුතින් සකස් කරන ලද ඉඩම් සම්බන්ධ ලේඛන හා අවලංගු කරන ලද ලේඛන විධිමත් ලෙස වාර්තාගත කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ අවසානයේ දී කාර්යාලවල පවතින ලේඛනවල සත්‍ය අගයන් updated information තීරුවේ නිරූපිතයි.

| දිස්ත්‍රික්කය | | HISTORIC INFORMATION | VALIDATED INFORMATION | UPDATED INFORMATION |
|---|---|---|---|---|
| ගාල්ල | දීමනාපත්‍ර | 52,593 | 54,813 | 55,565 |
| | බලපත්‍ර | 46,004 | 49,829 | 52,467 |
| | දී.බදු | 10 | 341 | 399 |
| | වාර්ෂික බදු | 4,869 | 4,520 | 5,075 |
| මාතර | දීමනාපත්‍ර | 40,084 | 44,772 | 45,204 |
| | බලපත්‍ර | 22,852 | 34,878 | 35,917 |
| | දී.බදු | තොරතුරු නොමැත | 163 | 186 |
| | වාර්ෂික බදු | 7,532 | 7,232 | 7,631 |
| හම්බන්තොට | දීමනාපත්‍ර | 54,931 | 48,511 | 49,567 |
| | බලපත්‍ර | 60,036 | 38,735 | 39,068 |
| | දී.බදු | 33 | 564 | 580 |
| | වාර්ෂික බදු | 1,600 | 2,272 | 2,378 |
| දකුණු පළාත | දීමනාපත්‍ර | 147,608 | 148,096 | 150,336 |
| | බලපත්‍ර | 128,892 | 123,442 | 127,452 |
| | දී.බදු | 43 | 1,068 | 1,165 |
| | වාර්ෂික බදු | 14,001 | 14,024 | 15,084 |

Historic Information – 2022.10.31 දිනට පැවති තොරතුරු
Validated Information – 2022.12.31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු
Updated Information – 2023.12.31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු

# දකුණු පළාතේ ඉඩම් තොරතුරු

| රාජකාරී වර්ගය | | | | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | Historic Infromation | Validated Infromation | Updated Infromation | Historic Infromation | Validated Infromation | Updated Infromation | Historic Infromation | Validated Infromation | Updated Infromation | Historic Infromation | Validated Infromation | Updated Infromation |
| 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | | | 52593 | 54813 | 55565 | 40084 | 44772 | 45204 | 54931 | 48511 | 49567 | 147608 | 148096 | 150336 |
| 2 | බලපත්‍ර සංඛ්‍යාව (දීමනාපත්‍ර සකස් කිරීමට ඇති) | | | 46004 | 49829 | 52467 | 22852 | 34878 | 35917 | 60036 | 38735 | 39068 | 128892 | 123442 | 127452 |
| 3 | දීර්ඝ කාලීන බදු | 1.නේවාසික | | 2 | 104 | 150 | 0 | 43 | 46 | 10 | 464 | 467 | 12 | 611 | 663 |
| | | 2.කෘෂිකාර්මික | | 8 | 144 | 157 | 0 | 77 | 93 | 22 | 10 | 13 | 30 | 231 | 263 |
| | | 3.වාණිජ | 3.1. ව්‍යාපාර | 0 | 68 | 67 | 0 | 34 | 39 | 1 | 89 | 99 | 1 | 191 | 205 |
| | | | 3.2 සන්නිවේදන කුළුණු | 0 | 7 | 7 | 0 | 3 | 3 | 0 | 0 | 0 | 0 | 10 | 10 |
| | | | 3.3 වෙනත් | 0 | 18 | 18 | 0 | 6 | 5 | 0 | 1 | 1 | 0 | 25 | 24 |
| 4 | වාර්ෂික බදු | 1ඉ.කො.75 බලපත්‍ර | | 885 | 1171 | 1335 | 726 | 641 | 801 | 379 | 1545 | 1608 | 1990 | 3357 | 3744 |
| | | 2 ඉ.කො.76 බලපත්‍ර | | 0 | 4 | 4 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 5 | 5 |
| | | 3ඉ.කො.71 බලපත්‍ර | | 0 | 1 | 4 | 0 | 4 | 3 | 0 | 1 | 1 | 0 | 6 | 8 |
| | | 4 ඉ.කො.78 බලපත්‍ර | | 3984 | 3344 | 3732 | 6806 | 6586 | 6826 | 1221 | 726 | 769 | 12011 | 10656 | 11327 |
| 5 | රජයේ ආයතන වෙත ඉඩම් පැවරීම | 1.දෙපාර්තමේනතු ඉඩම් නියෝග | | 157 | 89 | 142 | 76 | 70 | 96 | 119 | 184 | 214 | 352 | 343 | 452 |
| | | 2.පළාත් පාලන ආයතන වලට | | 0 | 21 | 35 | 0 | 2 | 4 | 0 | 71 | 14 | 0 | 94 | 53 |
| | | 3.ත්‍රිවිධ හමුදා | | 0 | 20 | 4 | 0 | 6 | 1 | 0 | 0 | 1 | 0 | 26 | 6 |
| 6 | ආගමික ආයතන සඳහා ඉඩම් පැවරීම | 1.ප්‍රාරම්භක බදුකර | | 0 | 27 | 19 | 0 | 6 | 0 | 0 | 5 | 2 | 0 | 38 | 21 |
| | | 2.පූජා ඔප්පු | | 0 | 19 | 13 | 0 | 4 | 2 | 0 | 28 | 19 | 0 | 51 | 34 |
| | | 3.නිදහස් දීමනාපත්‍ර | | 0 | 0 | 5 | 0 | 5 | 0 | 0 | 41 | 17 | 0 | 46 | 22 |
| | | 4.වෙනත් ආගමික සිද්ධස්ථාන | | 0 | 0 | 0 | 0 | 29 | 30 | 0 | 0 | 0 | 0 | 29 | 30 |
| 7 | නිදහස් දීමනාපත්‍ර | 1.සුනාමි දිමනාපත්‍ර | | 1713 | 2397 | 1899 | 693 | 1365 | 583 | 1019 | 1058 | 897 | 3425 | 4820 | 3379 |
| | | 2.රණවිරු | | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 11 | 0 | 1 | 11 |
| | | 3.ආපදා(ගංවතුර) | | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 53 | 53 | 0 | 54 | 54 |
| | | 4.නේවාසික | | 0 | 23 | 4 | 0 | 230 | 21 | 0 | 17 | 31 | 0 | 270 | 56 |
| | | 5.උරුමය වැඩසටහන යටතේ | | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 8 | නියා දන සාධන පත්‍ර | | | 0 | 335 | 353 | 0 | 2 | 101 | 0 | 0 | 0 | 0 | 337 | 454 |
| 9 | සන්තකය ආපසු ගැනීම | අනවසර අල්ලා ගැනීම් සංඛ්‍යාව | | 0 | 135 | 56 | 0 | 0 | 8 | 0 | 0 | 95 | 0 | 135 | 159 |
| | | අස් කිරීමේ නිවේදන නිකුත් කර ඇති සංඛ්‍යාව | | 0 | 118 | 112 | 0 | 0 | 3 | 0 | 0 | 76 | 0 | 118 | 191 |

ඉහත දිස්ත්‍රික් මට්ටමින් දක්වා ඇති තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පහත දැක්වේ.

| ගාල්ල දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| අක්මීමණ | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1975 | 2104 | 2165 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 4709 | 4763 | 5054 |
| | 3 | දීර්ඝ කාලීන බදු | - | 9 | 15 |
| | 4 | වාර්ෂික බදු | 185 | 198 | 212 |
| අම්බලන්ගොඩ | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2054 | 1842 | 1869 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2562 | 624 | 646 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 2562 | 5 | 5 |
| | 4 | වාර්ෂික බදු | 32 | 33 | 36 |
| බද්දේගම | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 976 | 976 | 994 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 483 | 483 | 523 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 483 | 5 | 9 |
| | 4 | වාර්ෂික බදු | 85 | 77 | 84 |
| බලපිටිය | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1976 | 2358 | 2413 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 673 | 899 | 931 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 673 | 8 | 8 |
| | 4 | වාර්ෂික බදු | 18 | 36 | 38 |
| බෙන්තොට | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1593 | 2111 | 2129 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2304 | 1352 | 1420 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 2304 | 26 | 26 |
| | 4 | වාර්ෂික බදු | 85 | 85 | 98 |
| බෝපේ පෝද්දල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1216 | 1362 | 1380 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 402 | 373 | 393 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 402 | 14 | 14 |
| | 4 | වාර්ෂික බදු | 15 | 27 | 43 |
| ඇල්පිටිය | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 13195 | 5214 | 5350 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 621 | 5107 | 5221 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 621 | 69 | 71 |
| | 4 | වාර්ෂික බදු | 610 | 657 | 664 |
| ගෝනාපීනුවල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1214 | 1145 | 1152 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 172 | 180 | 223 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 172 | 4 | 5 |
| | 4 | වාර්ෂික බදු | 28 | 38 | 50 |
| හබරාදූව | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1033 | 1299 | 1327 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 571 | 289 | 297 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 571 | 15 | 15 |
| | 4 | වාර්ෂික බදු | 80 | 77 | 86 |
| හික්කඩුව | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 332 | 378 | 378 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 355 | 388 | 388 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 355 | 13 | 22 |
| | 4 | වාර්ෂික බදු | 0 | 11 | 21 |
| ඉමදූව | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2741 | 2348 | 2349 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 725 | 1763 | 1826 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 725 | 13 | 14 |
| | 4 | වාර්ෂික බදු | 280 | 265 | 277 |

| ගාල්ල දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| කඩවත්සතර | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 89 | 87 | 87 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 121 | 18 | 18 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 121 | 25 | 29 |
| | 4 | වාර්ෂික බදු | 18 | 21 | 28 |
| කරන්දෙණිය | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1659 | 3923 | 3964 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 6156 | 6911 | 7209 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 6156 | 28 | 20 |
| | 4 | වාර්ෂික බදු | 97 | 78 | 104 |
| නාගොඩ | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 3841 | 3748 | 3818 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 8639 | 4743 | 4958 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 8639 | 24 | 24 |
| | 4 | වාර්ෂික බදු | 439 | 433 | 443 |
| නියාගම | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 5911 | 6220 | 6321 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 5566 | 4210 | 4597 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 5566 | 16 | 17 |
| | 4 | වාර්ෂික බදු | 308 | 154 | 163 |
| නෙළුව | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 4656 | 5137 | 5174 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 5561 | 6744 | 7229 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 5561 | 11 | 25 |
| | 4 | වාර්ෂික බදු | 470 | 311 | 323 |
| තවලම | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 3579 | 3386 | 3434 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 50 | 5655 | 6034 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 50 | 7 | 7 |
| | 4 | වාර්ෂික බදු | 1077 | 984 | 1019 |
| වැලිවිටිය දිවිතුර | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2126 | 1408 | 1438 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1341 | 1452 | 1503 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 1341 | 5 | 5 |
| | 4 | වාර්ෂික බදු | 33 | 23 | 28 |
| යක්කලමුල්ල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 174 | 6240 | 6287 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1720 | 2274 | 2323 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 1720 | 37 | 37 |
| | 4 | වාර්ෂික බදු | 994 | 984 | 1066 |
| වඳුරඹ | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1740 | 2125 | 2125 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1366 | 1187 | 1266 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 1366 | 2 | 1 |
| | 4 | වාර්ෂික බදු | 0 | 5 | 257 |
| රත්ගම | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | | 736 | 736 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1120 | 36 | 37 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 1120 | 3 | 24 |
| | 4 | වාර්ෂික බදු | 9 | 14 | 24 |
| මාදම්පේ | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 513 | 666 | 675 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 787 | 378 | 371 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 787 | 2 | 6 |
| | 4 | වාර්ෂික බදු | 6 | 9 | 11 |

| මාතර දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| අකුරැස්ස | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 7487 | 6782 | 6836 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1155 | 3703 | 3821 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 21 | 21 |
| | 4 | වාර්ෂික බදු | 1090 | 1094 | 1118 |
| අතුරලිය | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1360 | 2518 | 2599 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 463 | 4270 | 4284 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 0 | 0 |
| | 4 | වාර්ෂික බදු | 490 | 443 | 458 |
| කඹුරුපිටිය | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 2672 | 2375 | 2396 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1650 | 1697 | 1866 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 7 | 8 |
| | 4 | වාර්ෂික බදු | 169 | 169 | 186 |
| කිරින්ද පුහුල්වැල්ල | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 985 | 983 | 994 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 577 | 378 | 365 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 8 | 11 |
| | 4 | වාර්ෂික බදු | 170 | 180 | 184 |
| කොටපොල | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 5205 | 5466 | 5486 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2817 | 2496 | 2632 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 16 | 19 |
| | 4 | වාර්ෂික බදු | 1314 | 1146 | 1182 |
| තිහගොඩ | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 658 | 658 | 661 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 126 | 153 | 169 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 3 | 3 |
| | 4 | වාර්ෂික බදු | 123 | 123 | 145 |
| දික්වැල්ල | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 698 | 829 | 852 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 135 | 158 | 181 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 11 | 15 |
| | 4 | වාර්ෂික බදු | 9 | 75 | 87 |
| දෙවිනුවර | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1176 | 1406 | 1410 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1200 | 1078 | 1170 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 3 | 3 |
| | 4 | වාර්ෂික බදු | 52 | 66 | 80 |

| මාතර දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| පස්ගොඩ | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 6598 | 8201 | 8238 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2341 | 9372 | 9534 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 13 | 18 |
| | 4 | වාර්ෂික බදු | 962 | 883 | 949 |
| පිටබැද්දර | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 5410 | 7527 | 7568 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 6990 | 3696 | 3957 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 45 | 50 |
| | 4 | වාර්ෂික බදු | 1501 | 1420 | 1501 |
| මාතර | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1300 | 1595 | 1614 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 63 | 63 | 47 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 6 | 7 |
| | 4 | වාර්ෂික බදු | 110 | 113 | 117 |
| මාලිම්බඩ | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 950 | 777 | 797 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 246 | 190 | 175 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 6 | 7 |
| | 4 | වාර්ෂික බදු | 27 | 25 | 32 |
| මුලටියන | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1728 | 1734 | 1772 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 4614 | 6788 | 6819 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 9 | 9 |
| | 4 | වාර්ෂික බදු | 1133 | 1111 | 1160 |
| වැලිගම | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1908 | 1918 | 1958 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 359 | 359 | 336 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 3 | 2 |
| | 4 | වාර්ෂික බදු | 74 | 94 | 118 |
| වැලිපිටිය | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 1664 | 1722 | 1742 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 116 | 396 | 412 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 11 | 10 |
| | 4 | වාර්ෂික බදු | 214 | 192 | 200 |
| හක්මන | 1 | දීමනා පත්‍ර සංඛ්‍යාව | 285 | 281 | 281 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | | 81 | 149 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 1 | 3 |
| | 4 | වාර්ෂික බදු | 94 | 98 | 114 |

| හම්බන්තොට දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 5279 | 2122 | 2284 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 8071 | 4759 | 4848 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 432 | 447 |
| | 4 | වාර්ෂික බදු | 89 | 980 | 980 |
| තිස්සමහාරාමය | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 11315 | 11315 | 11563 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 19065 | 7763 | 7715 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 57 | 58 |
| | 4 | වාර්ෂික බදු | 590 | 590 | 612 |
| අම්බලන්තොට | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 105 | 3525 | 3586 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 509 | 2168 | 2214 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 10 | 12 |
| | 4 | වාර්ෂික බදු | 346 | 64 | 65 |
| තංගල්ල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 3752 | 3701 | 3801 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2016 | 4167 | 4230 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 41 | 32 |
| | 4 | වාර්ෂික බදු | 17 | 18 | 31 |
| සූරියවැව | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2328 | 1499 | 1542 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 5385 | 2961 | 3017 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 2 | 4 |
| | 4 | වාර්ෂික බදු | 155 | 137 | 148 |
| වලස්මුල්ල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 4149 | 4149 | 4199 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 8026 | 3884 | 3898 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 1 | 1 |
| | 4 | වාර්ෂික බදු | 280 | 271 | 277 |

| හම්බන්තොට දිස්ත්‍රික්කය | | | Historic Information | Validated Information | Updated Information |
|---|---|---|---|---|---|
| අගුණුකොළපැලැස්ස | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 7007 | 4144 | 4265 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2934 | 2956 | 2946 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 32 | 1 | 1 |
| | 4 | වාර්ෂික බදු | 0 | 8 | 8 |
| ඕකෙවෙල | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 711 | 720 | 722 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 832 | 144 | 175 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 8 | 8 |
| | 4 | වාර්ෂික බදු | 11 | 13 | 16 |
| කටුවන | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 11254 | 8746 | 8823 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 1747 | 3107 | 3151 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 1 | 2 | 3 |
| | 4 | වාර්ෂික බදු | 0 | 114 | 130 |
| බෙලිඅත්ත | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 845 | 850 | 863 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 952 | 107 | 97 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 1 | 1 |
| | 4 | වාර්ෂික බදු | 56 | 58 | 72 |
| ලුණුගම්වෙහෙර | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2078 | 1622 | 1722 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 2593 | 3433 | 3436 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 4 | 4 |
| | 4 | වාර්ෂික බදු | 54 | 17 | 37 |
| වීරකැටිය | 1 | දීමනාපත්‍ර සංඛ්‍යාව | 6108 | 6118 | 6197 |
| | 2 | බලපත්‍ර සංඛ්‍යාව | 7906 | 3286 | 3341 |
| | 3 | දීර්ඝ කාලීන බදු | 0 | 5 | 9 |
| | 4 | වාර්ෂික බදු | 2 | 2 | 2 |

# අපගේ ක්‍රියාකාරකම් - 2023

**01. වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේ කණ්ඩායම් වැඩසටහන් :-**

විවිධ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල වාර්ෂික බලපත්‍ර නිකුත් කළහැකි ඉඩම් අලුතින් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මානක සිතියම් හා ක්ෂේත්‍රයේ පරීක්ෂා කර දැනටමත් නේවාසිකව සිටින හා වගා කටයුතු වෙනුවෙන් බුක්ති විඳින රජයේ රක්ෂිත ඉඩම් කොටස් සඳහා LC-75 සහ LC – 78 බලපත්‍ර නිකුත් කිරීමට හා අදාළ බදු මුදල් එකතු කර ගැනීමට ක්‍රියා කරනු ලබයි.

**02. කමිටු තක්සේරු වැඩසටහන් :-**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2021/06 චක්‍ර ලේඛනය අනුව දීර්ඝ කාලීන බදුකර සහ ගැණුම් මිල යටතේ බැහැර කිරීමට අනුමැතිය ලබා දී ඇති ඉඩම් මැන එම මැනුම අනුව රජයේ තක්සේරුව ලබා ගන්නා තෙක් ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මගින් ඉඩමේ දළ තක්සේරු වටිනාකම තක්සේරු කර බදු මුදල් හා ගැණුම් මිල අය කිරීම සඳහා මඟ පෙන්වීම හා සහයෝගය ලබාදීම මෙහි දී සිදු කරනු ලබයි.

**03. ඉඩම් කච්චේරි LCD ඉඩම් පරීක්ෂණ කණ්ඩායම් වැඩසටහන් :-**

ඉඩම් කච්චේරි වැඩසටහන යටතේ රජයේ ඉඩමක් ලබා දීම සඳහා තෝරාගෙන ඇති පුද්ගලයන් සඳහා එම ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම පිළිබඳ ලබාදෙන ක්ෂේත්‍ර තාක්ෂණික වාර්තා ලබාදීම සිදු කිරීම.

**04. ගැණුම් මිල සහන වැඩසටහන් :-**

ඉඩම් සංවර්ධන ආඥා පනත 19 (2) වගන්තිය යටතේ රජයේ තක්සේරුව අය කර නිකුත් කරන බලපත්‍රලාභීන් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022/02 චක්‍රලේඛනයේ ප්‍රතිපාදන මත තක්සේරු වර්ෂය සංශෝධන සහන කඩිනමින් ලබා දීම සඳහා ගැණුම් මිල බලපත්‍රලාභීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහන වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

**05. ජංගම සේවා සහ පළාත් දින වැඩසටහන් පැවැත්වීම :-**

ඉඩම් ගැටලු හා ආරවුල් විසඳීම හා විවිධ ඉඩම් සම්බන්ධ පොදු සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල මට්ටමින් ඉඩම් ජංගම සේවා හා පළාත් දින වැඩසටහන් සිදු කරන ලදී.

**06. පිස්කල් ගාස්තු ගෙවීම :-**

රජයේ ඉඩම් අනවසරයෙන් බුක්ති විඳින පුද්ගලයන් එම ඉඩම්වලින් ඉවත් කර ඉඩමේ සන්තකය ලබා ගැනීම සඳහා රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ ප්‍රතිපාදන මත මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ලබා ගනු ලබන නෙරපීම් අඥාව අනුව ඉඩමේ සන්තකය ලබා ගැනීමට අවශ්‍ය වියදම් හා ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලබයි.

**07. බඳු ඒකක පරීක්ෂාව :-**

මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බඳු ඒකක පරීක්ෂාව සිදු කරනු ලබයි. ඉඩම් ආදායම් අය කිරීමේ කටයුතු කාර්යක්ෂම හා විධිමත් කිරීම මෙම පසු විපරම් වැඩ සටහනේ අරමුණයි. එසේම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත මෙම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන ඒකකයේ සාමාජිකයන්ගෙන් මෙම කමිටුව සමන්විත බැවින් අභ්‍යන්තර විගණන කටයුත්ත ද මේ මගින් සපුරාගනු ලැබීමට හැකි වීම ද සාධනීය ලක්ෂණයකි. මෙමගින් හඳුනාගනු ලබන නිවැරදි විය යුතු කරුණු සහිත වාර්තාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කරන අතර දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ප්‍රගති සමාලෝචන හා කාර්යාල පරීක්ෂණ මගින් එම නිවැරදි කිරීම් පසු විපරම් කිරීම සිදු කරයි.

**08. ඉඩම් ගැටලු විසඳීමේ වැඩසටහන් :-**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ගැටලු හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ තීරණවලින් තෘප්තිමත් නොවී මෙම දෙපාර්තමේන්තුව වෙත විසඳුම් අපේක්ෂාවෙන් පැමිණෙන මහජනතාවගේ ගැටලු විසඳීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර විසඳුම් ලබා දීම.

**09. මැනුම් කටයුතු :-**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විවිධ රජයේ ඉඩම් අප දෙපාර්තමේන්තුවේ මානක නිලධාරීන් යොදවා මැනුම් කිරීම.

**10. මාණ්ඩලික නිලධාරී සාකච්ඡා පැවැත්වීම :-**

දෙපාර්තමේනතුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය විමසා බැලීම සඳහා සහ කාලානුරූපව ක්ෂේත්‍රයේ මතුවන ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් සාකච්ඡා කර ප්‍රතිපත්තිමය එකඟතාවයන්ට එළඹීම සඳහා ද්වි කාර්තුමය වශයෙන් දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මාණ්ඩලික නිලධාරී සාකච්ඡා පවත්වනු ලබයි.

**11. ප්‍රගති සමාලෝචන රැස්වීම් :-**

වාර්ෂික ඉලක්ක සාධනයට අදාල ප්‍රගති සාකච්ඡා කාර්තුමය වශයෙන් දිස්ත්‍රික්ක 03 සඳහා පැවැත්වීමට ක්‍රියාකරයි.

**12. පුහුණු වැඩසටහන් පැවැත්වීම :-**

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 03 හි කාර්යය මණ්ඩලය සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින ඉඩම්/ජනපද නිලධාරීන් සහ සංවර්ධන නිලධාරී (බඳු) සඳහා ඔවුන්ගේ දැනුම කුසලතාවය හා ආකල්ප සංවර්ධන මට්ටමින් වැඩසටහන් රැසක් පවත්වන ලදී.

ඉහත රාජකාරි ඉටු කළ ප්‍රමාණයන් පිළිබඳ දත්තයන් පහත පරිදි වේ.

| අංකය | වැඩසටහන | දිස්ත්‍රික් අනුව වැඩසටහන් ප්‍රමාණය | | | මුළු වැඩසටහන් සංඛ්‍යාව | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | මාතර | හම්බන්තොට | | | |
| 1 | වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේ කණ්ඩායම් වැඩසටහන් | 08 | 06 | 04 | 18 | 852 | අක්මීමණ, ඇල්පිටිය, කරණ්දෙනිය, නාගොඩ, නියාගම, නෙළුව, තවලම, යක්කලමුල්ල, වඳුරඹ, අකුරැස්ස, කඹුරුපිටිය, කොටපොල, තිහගොඩ, දෙවිනුවර, පස්ගොඩ, මාලිම්බඩ, මුලටියන, හක්මණ, වැලිගම, තංගල්ල, සූරියවැව, කටුවන, බෙලිඅත්ත, ලුණුගම්වෙහෙර |
| 2 | කම්ටු තක්සේරු වැඩසටහන් | 5 | 3 | 1 | 9 | 77 | බද්දේගම, තවලම, නාගොඩ, යක්කලමුල්ල, නියාගම, පිටබැද්දර, අකුරුස්ස, පස්ගොඩ, කටුවන, |
| 3 | LCD ඉඩම් පරීක්ෂණ කණ්ඩායම් වැඩසටහන් | 8 | 5 | 4 | 17 | 4625 | නෙළුව, තවලම, නියාගම, නාගොඩ, යක්කලමුල්ල, අක්මීමණ, බෝපෙ පෝද්දල, වඳුරඹ, කොටපොල, පිටබැද්දර, අකුරැස්ස, පස්ගොඩ, මුලටියන, තිස්සමහාරාමය, වලස්මුල්ල, කටුවන, වීරකැටිය |
| 4 | ගැණුම් මිළ සහන වැඩසටහන් | 6 | 2 | 1 | 9 | 538 | වඳුරඹ, ඇල්පිටිය, බලපිටිය, බෙන්තොට, නාගොඩ, කරන්දෙණිය, පස්ගොඩ, සූරියවැව, තිස්සමහාරාමය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | ජංගම සේවා සහ පළාත් දින වැඩසටහන් පැවැත්වීම | 18 | 11 | 9 | 38 | 487 | ඇල්පිටිය, කරණ්දෙනිය, නියාගම, අක්මීමණ, ඉමදූව, මුලටියන, පස්ගොඩ, පිටබැද්දර, අකුරැස්ස, දික්වැල්ල, තිස්සමහාරාමය, වීරකැටිය, සූරියවැව |
| 6 | පිස්කල් ගාස්තු ගෙවීම | 7 | 6 | 1 | 14 | 28 | අක්මීමණ, නාගොඩ, තවලම, නියාගම, බෙන්තොට, කරණ්දෙනිය, ගාල්ල කඩවත් සතර, දික්වැල්ල, අතුරලිය පිටබැද්දර, පස්ගොඩ, වැලිගම, හම්බන්තොට, අම්බලන්තොට |
| 7 | බදු ඒකක පරීක්ෂාව | 4 | 6 | 5 | 15 | අදාළ නොවේ. | බද්දේගම, නෙළුව, හබරාදූව, යක්කලමුල්ල, වැලිගම, දික්වැල්ල, දෙවිනුවර, කොටපොළ, පස්ගොඩ, අකුරැස්ස, අම්බලන්තොට, කටුවන, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, හම්බන්තොට |
| 8 | ඉඩම් ගැටලු විසඳීමේ වැඩසටහන් | 6 | 3 | 2 | 11 | 575 | බෙන්තොට, වඳුරඹ, බලපිටිය, නාගොඩ, කරණ්දෙනිය, අක්මීමණ, පස්ගොඩ, කොටපොළ, වැලිගම, වීරකැටිය සූරියවැව |
| 9 | මැනුම් කටයුතු | 50 | 1 | 16 | 68 | 119 | ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි සියළු ප්‍රා.ලේ. කාර්යාල සහ මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රා.ලේ. කාර්යාලය |
| 10 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡා පැවැත්වීම | 1 | 1 | 0 | 2 | අදාළ නොවේ | දෙනියාය ස්වදේශ කටයුතු අමාත්‍යාංශ සංචාරක නිකේතනය සහ<br>කන්නෙලිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය |
| 11 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | 11 | 11 | 11 | 33 | අදාළ නොවේ. | ගාල්ල - ප්‍රධාන කාර්යාල ශ්‍රවනාගාරය<br>මාතර- මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරය.<br>හම්බන්තොට-<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරය. |


**12.** 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

| **පුහුණු වැඩසටහන** | **සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව** | **සහභාගී වූ නිලධාරීන් ගණය** | **පුහුණු වැඩසටහන පැවැත් වූ ස්ථානය** |
|---|---|---|---|
| ආකල්ප ප්‍රවර්ධනය සහ රසවින්දනය | 72 | ප්‍රධාන කාර්යාලයේ සහ ගාල්ල සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ නලධාරීන් | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| රජයේ ඉඩම් තක්සේරුකරණය | 154 | දකුණු පළාතේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්, ඉඩම්/ජනපද නිලධාරීන්, සංවර්ධන නිලධාරී(බදු) | දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - වක්වැල්ල |
| වන නීතිය හා අවශේෂ කැලෑ කළමනාකරණය | 41 | ඉඩම්/ජනපද නිලධාරීන් | ඌව පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - පස්සර |
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් ආදායම් රැස් කිරීම හා ගිණුම් ගත කිරීම . | 86 | සංවර්ධන නිලධාරී(බදු) | දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - වක්වැල්ල |
| කුසලතා ප්‍රවර්ධන,මානව සබඳතා සහ ධනාත්මක චින්තනය | 66 | සංවර්ධන නිලධාරී(බදු) | ජාතික නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය - ඇඹිලිපිටිය |
| ධනාත්මක ආකල්ප හා කණ්ඩායම් ක්‍රියාකාරකම් | 58 | ප්‍රධාන කාර්කාලය සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවල නිලධාරීන් | ජාතික නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය - ඇඹිලිපිටිය |
| ආකල්ප සංවර්ධන හා ආතති කළමණාකරණය | 75 | ප්‍රධාන කාර්යාලයේ සහ ගාල්ල සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ නලධාරීන් | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| දීර්ඝ කාලීන බදුකර සකස් කිරිමට අදාළ අනුරේඛන සකස් කිරීම | 18 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම්/ජනපද නිලධාරීන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරය - හම්බන්තොට |
| අනුරේඛන සකස් කිරීම | 46 | ග්‍රාම නිලධාරීන් | ඇල්පිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| බදු නිර්දේශ වාර්තා නිවැරදිව සම්පූර්ණ කිරීම | 95 | ගාල්ල/මාතර දිස්ත්‍රික්කවල සංවර්ධන නිලධාරීන් (බදු) | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය සහ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. |


## පුහුණු වැඩසටහන්














## ක්ෂේත්‍ර වැඩසටහන්








## මාණ්ඩලික සහ ප්‍රගති සමාලෝචන රැස්වීම්

















දකුණු පළාත් සභාවේ වත්මන් නියමුවාණන් වන දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේ මැතිතුමාට,



අවැසි මගපෙන්වීම් ලබා දෙන දකුණු පළාත් ප්‍රධාන ලේකම් නීතිඥ සුමිත් අලහකෝන් මහතාට,

අපව සමීපව අධීක්ෂණය කරන අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ ලේකම් රංජිත් යාපා මහතාට,

දකුණු පළාතේ සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණය කරන ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්ට,

අපව මෙහෙයවන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් සේනක පල්ලියගුරුගේ මහතාට,

ඉඩම් රාජකාරී සම්බන්ධ බිම් මට්ටමේ සියළු වගකීම් ඉටු කරන දකුණු පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් හා ගණකාධිකාරීවරුන්ට

දකුණු පළාතේ ඉඩම් රාජකාරී අධීක්ෂණය කරන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් බී.ජී.නයෝමි ඩී.සඳමාලි, පී.ජී.ජනිතා කුමුදුනී හා ගණකාධිකාරී අයි.බී.යූ.ඩී.ගමගේ මහත්මීන්ට සහ මෙම ග්‍රන්ථය සංස්කරණය කළ සහකාර ඉඩම් කොමසාරිස් එම්.එච්.පී.ආර්.මධුසංඛ මහතාට,

ගාල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් පී.ජී.අනුර, මාතර දිස්ත්‍රික් සහකාර ඉඩම් කොමසාරිස් (වැ/බ) එම්.අබේරත්න, හම්බන්තොට දිස්ත්‍රික් සහකාර ඉඩම් කොමසාරිස් (වැ/බ) කේ.බී.නීල් ඩග්ලස් යන මහත්වරුන්ට

රජයේ මිනින්දෝරු කේ.එල්.වී.මධුෂිකා මිය සහ පී.එල්.එස්.ඒ.ප්‍රියංකර මයාට

හිටපු මාතර දිස්ත්‍රික් සහකාර ඉඩම් කොමසාරිස් නිහාල් චන්ද්‍රසිරි හා අප දෙපාර්තමේන්තුවේ හිටපු රජයේ මිනින්දෝරු එම්.ඩී.ආර්.එස්. ගුණසේකර යන මහත්වරුන්ට,

මූලස්ථාන ඉඩම් නිලධාරී එම්.ජී.සමරසේන, කේ.වී.සුනිල්, සුසන්ත චාමල්, ඩී.සී.කලංසූරිය මහත්වරුන්ට සහ මූලස්ථාන ඉඩම් නිලධාරී කේ.සී.රුක්මාලි මිය සහ පරිපාලන නිලධාරී ආර්.එන්.එම්.මුදලිගේ මහත්මීන්ට,

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දෙපාර්තමේන්තුවේ රාජකාරී ඉටුකරනු ලබන ඉඩම් නිලධාරීන්, ජනපද නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ට ඇතුළු ඉඩම් අංශවල සේවයේ නියුතු සියලුම නිලධාරීන්ට හා ග්‍රාම නිලධාරීවරුන්ට,

මෙම ග්‍රන්ථය නිර්මාණය කිරීමට සහය වූ සැලසුම් අංශයේ එම්.ජී. ප්‍රියන්ත, නිරෝෂා ශ්‍යාමලී, එච්.ජී.යූ. එරන්දි සහ ගාල්ල අංශයේ දීපිකා මහආරච්චි යන සංවර්ධන නිලධාරී මහත්ම මහත්මීන්ට

අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවල ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, රියදුරු මහතුන්, කාර්යාල කාර්ය සහායකවරුන් ඇතුළු සියලුම නිලධාරීන්ට

**ප්‍රණාමය !**

# අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



මාගේ අමාත්‍යාංශය තුළ ඇති ඉතා වැදගත් ආයතනයක් වන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, දකුණු පළාතේ දිස්ත්‍රික්ක 3 හි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 50 ක් තුළ ඇති රජයේ ඉඩම් කළමනාකරණය සඳහා සම්බන්ධ වෙමින් පළාත් සභාවේ තුන්වන විශාලතම ආදායම් මාර්ගය වන රජයේ ඉඩම් ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලියට ද දායකත්වය ලබා දෙයි. එම දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක් තිස්සේ සිදු කරන ව්‍යවස්ථාපිත රාජකාරියක් වන රජයේ ඉඩම් තියාදෙන ක්‍රියාවලියට අදාළ තොරතුරු, ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් නිවැරදි කර වඩාත් විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සකස් කර ගැනීමට ක්‍රියා කිරීම පැසසුම් කටයුතුය.රජයේ ඉඩම් තියාදන ක්‍රියාවලියට අදාළව යාවත්කාලීන කරන ලද එම තොරතුරු හා 2023 වර්ෂය තුළ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් අත් කරගත් ප්‍රගතිය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම ද කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීමකි.

පළාත් ඉඩම් කොමසාරිස්වරයා සිය පණිවිඩය තුළ මනාවින් පැහැදිලි කරන පරිදි රටේ අද පවතින ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස රාජ්‍ය ඉඩම් තියාදන ක්‍රියාවලිය මෙහෙයවීමට දර්ශනයක් සහිතව දක්වන කැපවීම අගය කරන අතර එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට කැපවන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ සුබ පැතුම් පිරිනමමි.

රංජිත් යාපා
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය.

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**
දකුණු පළාත